# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,919 - 2015 ජුනි මස 12 වැනි සිකුරාදා - 2015.06.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 968 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 987 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ජූලි මස 03 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ජුනි මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

965- B 80955—5,302 (2015/06)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

- (i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
- (ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
- (iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
- (iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
- (v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
- (vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු — ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — අම්පාර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2015 ජූලි මස 13 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 මැයි මස 26 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| අම්පාර | කල්මුණ | අම්පාර දිස්ත්‍රික්කයේ නෛයිපට්ටිමුණ මුස්ලිම් කොට්ඨාසයේ උප්පැන්න, මරණ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |

06-421

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කොළඹ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2015 ජූලි මස 13 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 මැයි මස 28 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| කොළඹ | කොළඹ | කොළඹ කොට්ඨාසයේ අළුත්කඩේ ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය. | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කොළඹ 05. |

06-420

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගම්පහ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2015 ජූලි මස 13 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,<br>
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 මැයි මස 28 වැනි දින,<br>
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,<br>
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| ගම්පහ | බියගම | බටහිර සියනෑ කෝරළය කොට්ඨාසයේ මල්වාන - යටිහේන ප්‍රදේශයේ අතිරේක මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ |

06-418

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මන්නාරම දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2015 ජූලි මස 13 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,<br>
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 මැයි මස 27 වැනි දින,<br>
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,<br>
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| මන්නාරම | නානාට්ටන් | නානාට්ටන් කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය. | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මන්නාරම |

06-367

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — අම්පාර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2015 ජුලි මස 13 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 මැයි මස 25 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| අම්පාර | සම්මන්තුරය | මල්ලිගෙයිතිවු කොට්ඨාසයේ සාමාන්‍ය විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |

06-317

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගම්පහ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2015 ජුලි මස 13 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 මැයි මස 25 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| ගම්පහ | කැලණිය | දළුගම කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා බටහිර සියනෑ කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ |

06-316

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කොළඹ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2015 ජූලි මස 13 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 මැයි මස 25 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| කොළඹ | තිඹිරිගස්යාය | කොල්ලුපිටිය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කොළඹ |

06-315

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### දෙමළ භාෂාවෙන් විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මන්නාරම දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2015 ජූලි මස 13 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 මැයි මස 25 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| මන්නාරම | මඩු | ඉරණායි ඉලුප්පයිකුලම් කොට්ඨාසයේ උප්පැන්න මරණ හා මඩු කොට්ඨාසයේ විවාහ රෙජිස්ට්‍රාර් ධුරය (සාමාන්‍ය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මන්නාරම |

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මන්නාරම | මාන්තෙයි බටහිර | මාන්තෙයි උතුර කොට්ඨාසයේ උප්පැන්න මරණ හා මාන්තෙයි බටහිර කොට්ඨාසයේ විවාහ රෙජිස්ට්‍රාර් ධූරය (සාමාන්‍ය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මන්නාරම. |

06-314

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

අංක 1912 සහ 2015.04.24 දිනැති *ගැසට් පත්‍රයේ* පල වූ අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කරවාහුපත්තු කොට්ඨාසයේ නෛපට්ටිමුණ ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්ධූරය සඳහා ඉල්ලුම්පත් කැඳවීමේ දැන්වීම අවලංගු කිරීම

අංක 1912 සහ 2015.04.24 දිනැති *ගැසට් පත්‍රයේ* පල වූ ඉහත තනතුර සඳහා ඉල්ලුම්පත් කැඳවීමේ දැන්වීම මෙයින් අවලංගු කරන බව කාරුණිකව දැනුම් දෙමි.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 මැයි මස 27 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/A3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

06-419

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

***නීති නිලධාරී (විධායක සේවා ශ්‍රේණියේ III ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම***

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය* :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබාගන්නා අපේක්‍ෂකයින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ. එහි දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 6 යටතේ සඳහන්) ලකුණු දීමේ පරිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණය පවත්වනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම්* :-

(i) *අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්* :
ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම හෝ /විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

(ii) *පළපුරුද්ද* :
ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් අනතුරුව වසර තුනකට (03) නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

(iii) *කායික සුදුසුකම්* :

සෑම අපේක්‍ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(iv) *වෙනත් සුදුසුකම්* :
- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
- අයදුම්පත් කැඳවන අවසාන දිනයට මෙම තනතුර සඳහා බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.
- අ. පො. ස. (සා. පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාවට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි* :-

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. නීති නිලධාරී III වැනි ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමු වැනි කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007ට අනුව හා ඊට අනුෂාංගික තනතුරට බැඳී වසර 5ක් ඇතුළත සේවාවට බැඳුණු භාෂාවට අතිරේකව බැඳුණු රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබාගත යුතුය.

(iv) මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති හා ආයතනය සංග්‍රහයේ විධිවිධානයන්ට යටත් වේ.

04. *වයස් සීමාව* :
ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

05. *වැටුප් පරිමාණය* :
මෙම තනතුරට රු. 22,935 - 10 x 645 - 8 x 790- 17 x 1,050 - රු. 53,555 ක මාසික වැටුප් පරිමාණයක් හිමිය. (2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006හි අංක SL - 1 - 2006 වැටුප් ඛණ්ඩය)

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු දීමේ පරිපාටිය පදනම් කරගනු ලැබේ.

| | *විෂයය* | *උපරිම ලකුණු* |
|---|---|---|
| 01. | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 |
| 02. | අතිරේක වෘත්තීය සුදුසුකම් | 15 |
| 03. | අතිරේක පළපුරුද්ද<br>(එක් වසරකට ලකුණු 05කි)<br>(වෘත්තීය සුදුසුකම් යටතේ නීතිඥවරයෙකු ලෙස අවශ්‍ය වන අවම අවුරුදු 03ක සේවා කාලයට අමතරව) | 30 |
| 04. | ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය | 15 |
| 05. | පරිගණක හැකියාව, තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම | 15 |
| 06. | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | 05 |
| | මුළු ලකුණු | 100 |

07. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය* :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතික වල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,

08. *අයදුම්පත් ඉදිරිපත් කිරීම* :

(අ) අයදුම්පත් 2015.07.12 දිනට හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

කොමසාරිස් ජනරාල්,
මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව,
තැ. පෙ. අංක 533,
අංක 341, ඇල්විටිගල මාවත,
කොළඹ 05.

(ආ) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 09 දක්වාත්, 02 වන පිටුව අංක 10 සිට 15 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

(ඇ) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙලවරේ "මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(ඈ) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලක විදුහල්පතිවරයකු/සාමදාන විනිශ්වයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු/නීතිඥවරයකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු හෝ රු. 22,935 ක මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතු ය.

(ඉ) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(ඊ) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම* :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් හෝ පරස්පරතාවක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යාංශය.

අංක 01, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 05.

**ආදර්ශ අයදුම් පත්‍රය**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී තනතුර (III ශ්‍රේණිය) සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2015

01. 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදාහරණ : (PERERA N. B.)
1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

01. 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
2.3 රාජකාරි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය (පුරුෂ - 0, ස්ත්‍රී - 1) : ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

04. විවාහක/අවිවාහක බව (අවිවාහක - 1, විවාහක - 2) : ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

05. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

06. 6.1 උපන් දිනය : වර්ෂය ☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

6.2 අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස අවු. : ☐☐ මාස : ☐☐

දින : ☐☐

07. දුරකථන අංකය ☐☐☐☐☐☐☐☐☐☐

08. 8.1 ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු ලෙස දිවුරුම් දුන් වර්ෂය :————.
8.2 අයදුම්පත් කැඳවන අවසාන දිනට නීතිඥයෙකු ලෙස පළපුරුද්ද : අවු. :————.

09. 9.1 නීතිවේදී උපාධිය ලද වර්ෂය :————.
9.2 විශ්ව විද්‍යාලය :————.
9.3 සාමාර්ථය :————.
9.4 අතිරේක අධ්‍යාපන සුදුසුකම් :————.
9.5 අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා ලබා ඇති සාමාර්ථය :————.

10. 10.1 ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය :————.
10.2 තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම :————.

11. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියකදී වැරදිකරු වී ඇත් ද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

12. ඔබ මීට පෙර රජයේ සේවයේ යෙදී සිටියදී සේවය අවසන් කර තිබේ ද ? :————.

එසේ නම් විස්තර හා සේවය අවසන් කිරීමට හේතු ? :————.

13. අයදුම්කරුගේ සහතිකය :

මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැන ගැනීමට ලැබුනහොත්, ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමට ද, මෙම තනතුරට මා පත්කර ගැනීමෙන් පසුව එම වරද දැන ගැනීමට ලැබුනහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වන බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

(ගැසට් නිවේදනයේ 08 ඡේදයේ (ඈ) පරිදි විය යුතුය.)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ....................... (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හොඳින් හඳුනන බවත්, ඔහුගේ/ඇයගේ අත්සන ........... දින මා ඉදිරිපිටදී තබන ලද බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන ලද
නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාව තබා සහතික කළ යුතුයි.)

15. රාජ්‍ය සේවකයෙකු නම් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය :

මෙම ඉල්ලුම්කරු වන ................. මයා/මිය/මෙය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/පළාත් සභාවේ/ආයතනයේ ස්ථිර/ අනියම්/ තාවකාලික නිලධාරියකු/නිලධාරිනියක ලෙස සේවය කරන බවත්, මෙම තනතුර සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
හෝ බලය පැවරූ නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාව තබා සහතික කළ යුතුයි.)

06-377

---

## ජාතික සමාජ සංවර්ධන ආයතනය

(සමාජ සේවා, සුභසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය)

01. තනතුර : මහාචාර්ය - තනතුරු 01

01. වයසඃ අවුරුදු 55ට අඩු විය යුතුය. (දැනට මෙම ආයතනයේ සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව බලනොපායි)

02. අධ්‍යාපන සුදුසුකම් :(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින්/පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකින් ලබා ගත් සමාජ වැඩ/සමාජීය විද්‍යාවන් පිළිබඳ පළමු පන්තියේ හෝ දෙවන පන්තියේ (ඉහළ පෙළ) සාමාර්ථයක් සහිත උපාධියක්;

හෝ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින්/පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකින් සමාජ වැඩ පිළිබඳව හෝ සමාජීය විද්‍යාවන්ගෙන් ලබා ගත් පන්ති සාමාර්ථයක් රහිත උපාධිය සමග සමාජ වැඩ, සමාජ සුභසාදනය, සමාජ ප්‍රතිපත්ති, උපදේශනය, සමාජ/ප්‍රජා සංවර්ධනය යන විෂයන්ගෙන් හෝ අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින්/පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් අවම වශයෙන් එක් අවුරුදු කාල සීමාවකට නොඅඩු ශාස්ත්‍රපති උපාධියක්;

සහ

(ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින් /පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකින් සමාජ වැඩ පිළිබඳ හෝ සමාජීය විද්‍යාවන්ගෙන් ආචාර්ය උපාධියක් සම්පූර්ණ කිරීම. (සමාජ වැඩ ආචාර්ය උපාධිය සඳහා ප්‍රමුඛත්වය දෙනු ලැබේ.)

සහ

(ඇ) අදාළ ආචාර්ය උපාධිය ලැබීමෙන් පසු විශ්ව විද්‍යාල මට්ටමේ ඉගැන්වීම් හා පර්යේෂණ කාර්යයන්හි අවම වශයෙන් වසර 10ක අත්දැකීම් සමඟ අධ්‍යාපන පරිපාලනයෙහි ප්‍රමාණවත් ඇත්දැකීම්;

හෝ

(ඇ) ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 10ක සේවා පළපුරුද්දක් සහිතව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින්/පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකින් සමාජ වැඩ හෝ සමාජීය විද්‍යාවන්ගෙන් ආචාර්ය උපාධිය සම්පූර්ණ කිරීම;

සහ

(ඉ) ඉංග්‍රීසි භාෂාවෙන් මනා ලෙස වැඩ කිරීමට හැකියාවක් තිබිය යුතුය.

03. වැටුප් පරිමාණය : HM 2-3-2006 රු. 47,245- 12x1310 - රු. 62,965 (මාසිකව)

02. තනතුර : ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - තනතුරු 04

01. වයස : වයස අවු. 22ට නොඅඩු හා 45ට නොවැඩිවිය යුතුය. (දැනට රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වුවන්ට මෙම උපරිම වයස් සීමාව බලනොපායි.)

02. අධ්‍යාපන සුදුසුකම් :(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සමාජීය විද්‍යාවන්ගෙන් ප්‍රථම උපාධිය සමග සමාජවැඩ (Social Work) පිළිබඳ ආචාර්ය උපාධියක් ලබා තිබීම.

(ආ) පළපුරුද්ද
රජයේ හෝ රජය පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයක වසර 10කට නොඅඩු සමාජවැඩ අධ්‍යයන හා ඉගැන්වීම් අංශයන්හි පළපුරුද්දක් තිබීම.

03. වැටුප් පරිමාණය : AR 2-2006A රු. 34,550- 10x925 - රු. 43,880 (මාසිකව)

03. තනතුර : ජ්‍යෙෂ්ඨ පුහුණුනිලධාරි - තනතුරු 03

01. වයස් සීමාව : වයස අවු. 22ට නොඅඩු හා 45ට නොවැඩිවිය යුතුය. (දැනට රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවයේ නියුතු වුවන්ට මෙම උපරිම වයස් සීමාව බලනොපායි.)

02. අධ්‍යාපන සුදුසුකම් :(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සමාජීය විද්‍යාවන්ගෙන් ප්‍රථම උපාධිය සමග සමාජීය විද්‍යාවන්ගෙන් ආචාර්ය උපාධියක් ලබා තිබීම.

පළපුරුද්ද :
රජයේ හෝ රජය පිළිගත් ආයතනයක වසර 10කට නොඅඩු සමාජවැඩ පුහුණු කිරීමේ අංශයන්හි පළපුරුද්දක් තිබීම;

හෝ

(ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සමාජීය විද්‍යාවන්ගෙන් ප්‍රථම උපාධිය සමග සමාජීය විද්‍යාවන්ගෙන් පශ්චාත් උපාධියක් ලබා තිබීම;

හා

රජයේ හෝ රජය පිළිගත් ආයතනයක වසර 15කට නොඅඩු සමාජ වැඩ පුහුණු අංශයන්හි පළපුරුද්ද ලබා තිබීම

03. වැටුප් පරිමාණය : AR 2-2006A රු. 34,550- 10x925 - රු. 43,880 (මාසිකව)

සැ. යු.—මනෝවිද්‍යාත්මක උපදේශනය පිළිබඳ වර්ෂ 01ට වඩා නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ සුදුසුකමක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

04. තනතුර : ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී - තනතුරු 03

01. වයස : වයස අවු. 22ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතු ය. (දැනට රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව බලනොපායි.)

02. අධ්‍යාපන සුදුසුකම් :(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සමාජීය විද්‍යාවන්ගෙන් ප්‍රථම උපාධිය සමග සමාජීය විද්‍යාවන්ගෙන් ආචාර්ය උපාධියක් ලබා තිබීම.

පළපුරුද්ද :
රජයේ හෝ රජය පිළිගත් ආයතනයක වසර 10කට නොඅඩු සමාජ වැඩ පර්යේෂණ අංශයන්හි පළපුරුද්දක් තිබීම

හෝ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සමාජීය විද්‍යාවන්ගෙන් ප්‍රථම උපාධිය සමග සමාජීය විද්‍යාවන්ගෙන් පශ්චාත් උපාධියක් ලබා තිබීම

හා

රජයේ හෝ රජය පිළිගත් ආයතනයක වසර 15කට නොඅඩු සමාජ වැඩ පර්යේෂණය අංශයන්හි පළපුරුද්ද ලබා තිබීම

03. වැටුප් පරිමාණය : AR 2-2006A- රු. 34,550- 10x925 - රු. 43,880 (මාසිකව)

05. තනතුර : කථිකාචාර්ය II - තනතුරු 01

01. වයස : වයස අවු. 22ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ මෙම ආයතනයේ සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව බලනොපායි.)

02. අධ්‍යාපන සුදුසුකම් :(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් /උසස් අධ්‍යාපන ආයතනයකින් සමාජවැඩ (Social Work) පිළිබඳ පළමු හා දෙවැනි පන්තියේ (ඉහළ පෙළ) සාමාර්ථයක් සහිත උපාධියක් ලබා තිබීම.

හෝ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/උසස් අධ්‍යාපන ආයතනයකින් සමාජීය විද්‍යාවන්ගෙන් ලබාගත් ප්‍රථම උපාධිය සමග සමාජ වැඩ (Social Work) පශ්චාත් උපාධියක් ලබා තිබීම.

03. වැටුප් පරිමාණය : AR 1-2006 A— රු. 24,725-5x550-5 x 645-15x770 - රු. 42,250 (මාසිකව)

06. තනතුර : ඉංග්‍රීසි උපදේශක III - තනතුරු 01

01. වයස් සීමාව : වයස අවු. 22ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව බලනොපායි.)

02. අධ්‍යාපන සුදුසුකම් :(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව විෂයයක් සහිතව ලබාගත් උපාධියක්

හෝ

(ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ඉංග්‍රීසි භාෂාව, ඉංග්‍රීසි සාහිත්‍ය, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම් ක්‍රම වේදය සහිත උපාධිය

සහ

(ඇ) ඉංග්‍රීසි ඉගැන්වීම් පිළිබඳ පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

හෝ

(ඉ) ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ රජයේ පාසලක හෝ වෙනත් රජයේ උසස් අධ්‍යාපන ආයතනයක වසර 03කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

03. වැටුප් පරිමාණය : MA 4-2006A රු. 18,230- 10x365 - 15 x450 - 5x550 රු. 31,380

07. තනතුර : අධ්‍යක්ෂ (පාලන හා මුදල්) - තනතුරු 01

01. වයස : වයස අවු. 25ට නොඅඩු හා 50ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව බලනොපායි.)

02. අධ්‍යාපන සුදුසුකම් :(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිපාලන හෝ කළමනාකරණය පිළිබද ප්‍රථම උපාධිය සමග පරිපාලනය හෝ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

පළපුරුද්ද :

රාජ්‍ය සේවයේ, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක පරිපාලන හා මුදල් කටයුතු පිළිබඳව අවම වශයෙන් වසර 15ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම.

03. වැටුප් පරිමාණය : HM 1-3-2006 — රු. 41,745-15 x 1 ,100 - රු. 58,245 (මාසිකව)

08. **තනතුර : ගණකාධිකාරී** - තනතුරු 01

01. වයස : වයස අවු. 22ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතු ය. (දැනට රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතුවූවන්ට මෙම උපරිම වයස් සීමාව බලනොපායි.)

02. අධ්‍යාපන සුදුසුකම් : වරලත් ගණකාධිකාරී ආවසරික සහතිකය සමග අදාළ ක්ෂේත්‍රයේ වසර 5ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද හෝ CIMA/ ACCA,AB, කාණ්ඩ සහ I කොටස හෝ ගණකාධිකරණය (HNDA)/ වාණිජ පිළිබඳ උසස් තාක්ෂණ ඩිප්ලෝමා සහතිකය (HNDC), විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් වාණිජවේදී උපාධිය හෝ සමාන සුදුසුකම් සහිතව අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05ක සේවා පළපුරුද්ද

03. වැටුප් පරිමාණය : MM 1-1-2006— රු. 25,640-3x665-7 x 735-15x925 - රු. 46,655 (මාසිකව)

09. **තනතුර : වැඩසටහන් සහකාර (ස්ථානභාර)** III - තනතුරු 01

01. වයස් සීමාව : වයස අවු. 22ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතු ය. (දැනට රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතුවූවන්ට මෙම උපරිම වයස් සීමාව බලනොපායි.)

02. අධ්‍යාපන සුදුසුකම් :(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධිය

සහ

රජයේ හෝ රජයේ පිළිගත් ආයතනයකින් සමාජ වැඩ, උපදේශනය හෝ සමාජ සංවර්ධනය යන විෂයන්ට අදාළ වර්ෂ 01කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම

සහ

(ආ) රජයේ හෝ පිළිගත් ආයතනයක මධ්‍යස්ථානභාර කටයුතු පිළිබඳව අවම වශයෙන් එක් අවුරුද්දක පළපුරුද්දක්

03. වැටුප් පරිමාණය : MA 3-2006A— රු. 15600-10x215-4 x 240-15x320 - 7 x 360-රු. 26,030 (මාසිකව)

10. තනතුර : **භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි)** III - තනතුරු 01

01. වයස : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු. 22ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතු ය. (දැනට රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව බලනොපායි.)

02. අධ්‍යාපන සුදුසුකම් :(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක සිංහල/ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලබා ගත් උපාධියක් සහ අ. පො. ස. උසස්පෙළ සිංහල හා ඉංග්‍රීසි භාෂාව/සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් ලබා ගැනීම සහ සිංහල/ඉංග්‍රීසි භාෂා පරිවර්තනය පිළිබඳ නිපුනතාවය

සහ

(ආ) රජයේ හෝ රජය පිළිගත් ආයතනයක සිංහල/ඉංග්‍රීසි භාෂා පරිවර්තකයෙකු ලෙස වසර 02ක පළපුරුද්ද

03. වැටුප් පරිමාණය : MA 4-2006A— රු. 18,230-10x365-15 x 450-5x550 - රු. 31,380 (මාසිකව)

09. **තනතුර : ශ්‍රව්‍ය දෘශ්‍ය කාර්මික** III - තනතුරු 01

01. වයස : වයස අවු. 22ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතු ය. (දැනට මෙම ආයතනයේ සේවයේ නියුතුවූවන්ට උපරිම වයස් සීමාව බලනොපායි.)

02. අධ්‍යාපන සුදුසුකම් :(අ) අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී විද්‍යා විෂය ධාරාවෙන් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තෘතීය අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධක මට්ටම ලබා තිබීම.

(ඇ) තාක්ෂණික නිපුනතා/ප්‍රවීණතා
එක් එක් තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියමකර ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) මට්ටමට අඩු නොවන්නා වූ ශ්‍රව්‍ය දෘශ්‍ය කාර්මික තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබීම.

03. වැටුප් පරිමාණය : MA 2-2-2006A— රු. 14,610-10x145-7 x 170-4x290-20x345 - රු. 25,310 (මාසිකව)

*සියලුම තනතුරු සඳහා සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :*

1. තනතුර ස්ථිරය,
2. රජයේ අනුමත ප්‍රතිශතයන්ට අනුව සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.
3. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

සටහන : 1. අධ්‍යක්ෂ (පාලන හා මුදල්) තනතුර සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන්ටත් ගණකාධිකාරී තනතුර සඳහා එම සේවයේ නිලධාරීන්ටත් ද්වීතියන පදනම මත ඉල්ලුම් කළ හැකිය.

2. වැඩසටහන් සහකාර (ස්ථානභාර) තනතුර හැර අනෙකුත් තනතුරු පුරප්පාඩුව පවතින්නේ නාවල, රාජගිරියේ ප්‍රධාන කාර්යාලයේ වන අතර මෙම ආයතනයට කිසිදු ශාඛාවක් නොමැත. තෝරා ගන්නා අයදුම්කරුවන් පහත සඳහන් ලිපිනයේ ඇති ප්‍රධාන කාර්යාලයේ පමණක් සේවය කළ යුතු ය.

සේවා කොන්දේසි - 1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ විධිවිධානවලට හා රජය විසින් වරින්වර පනවනු ලබන නීති රීති හා රෙගුලාසිවලට යටත් විය යුතු ය.

අයදුම්කරුවන් සම්පූර්ණ ජීව දත්ත තොරතුරු ඇතුළත් අයදුම්පත් පහත දක්වා ඇති ලිපිනයට 2015.07.15 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම් කරන තනතුර ලිපිකවරයේ වම්පස ඉහළ කෙලවරේ සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ අපැහැදිලි හෝ ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. රාජ්‍ය අංශයේ සේවයේ නියුතු නිලධාරීන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

ආචාර්ය රිඩ්ලි ජයසිංහ,
අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික සමාජ සංවර්ධන ආයතනය.

2015 මැයි මස 28 වැනි දින,
ජාතික සමාජ සංවර්ධන ආයතනය,
අංක 488ඒ, නාවල පාර,
රාජගිරිය.

06-385

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-I ශ්‍රේණියේ පුරප්පාඩු

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති අධ්‍යාපන විද්‍යාපීඨ සහ ගුරු විද්‍යාලයන් හි ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-I ශ්‍රේණියේ පහත සඳහන් අයුරින් පවතින පුරප්පාඩු පිරවීම සඳහා අධ්‍යාපන ලේකම් විසින් අයදුම්පත් භාරගනු ලැබේ.

| *දිනය* | *පුරප්පාඩු ගණන* |
|---|---|
| 2012.07.01 | 35 |
| 2013.01.01 | 2 |
| 2013.07.01 | 3 |
| 2014.01.01 | 1 |
| 2014.07.01 | 3 |
| එකතුව | 44 |

2.0 මෙම නිවේදනයේ අග දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2015 ජූලි මස 08 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-I ශ්‍රේණියේ පුරප්පාඩු" යනුවෙන් හා තමා අයදුම්කරන තනතුර හා විද්‍යාපීඨය හෝ ගුරු විද්‍යාලය සඳහන් කළ යුතු ය. සියළුම අයදුම්කරුවන් විසින් අයදුම්පත් ස්වකීය ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*3.0 සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

3.1 තෝරාගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය සේවයේ පත්වීම්වලට අදාළ සාමාන්‍ය කොන්දේසිවලට ද ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් හා කොන්දේසිවලට සහ ඒවාට අදාළව වරින්වර නිකුත් කරනු ලබන සංශෝධන වලට ද, ආයතන සංග්‍රහයට ද, මුදල් රෙගුලාසිවලට ද, අංක 1589/30 හා 2009.02.20 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද යටත්ව ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-I ශ්‍රේණියට පත් කරනු ලැබේ.

3.2 තනතුරු සඳහා තෝරාගනු ලබන අපේක්ෂක අපේක්ෂිකාවන් සේවා අවශ්‍යතා අනුව කුමන අධ්‍යාපන විද්‍යා පීඨයක හෝ ගුරු විද්‍යාලයක වුව ද සේවය කිරීමට බැඳී සිටී.

3.3 මෙම *ගැසට් පත්‍රයේ* I කොටසේ දක්වා ඇති රාජ්‍ය සේවා තනතුරු සඳහා පත්කිරීම් වලට අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

*4.0 සාමාන්‍ය සුදුසුකම් :*

4.1 ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථාවේ 17 වැනි වගන්තිය අනුව උපාධිය ලබා ඇත්තේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් නොවේ නම් උසස් කිරීම සඳහා සුදුසුකම් ලැබීම පිණිස අ. පො. ස. (සා. පෙළ) හෝ සමාන විභාගයක දී ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ එයට උසස් සහතිකයක් ලබා තිබීම අවශ්‍යතාවක් වනු ඇත.

*5.0 අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

5.1 ගුරු අධ්‍යාපනඥ සේවයේ 2 වන පන්තියේ II වැනි ශ්‍රේණිය යටතේ උපලේඛනගත තනතුරක පස් වසරකට නොඅඩු සතුටුදායක සේවයක් සම්පූර්ණකර සේවයේ ස්ථිර කර තිබීම හා ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2- II ශ්‍රේණියට අයත් කාර්යක්ෂමතා කඩඉම සමත්වී තිබීම;

*හා*

5.2 අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ උපාධිය හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සහිතව පහත සඳහන් ශාස්ත්‍රීය හා වෘත්තීය සුදුසුකම් සම්පූර්ණකර තිබීම. :-

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් අධ්‍යාපනය පිළිබඳ පළමු පන්තියේ හෝ දෙවැනි පන්තියේ (ඉහළ) උපාධියක් ලබා තිබීම හෝ අධ්‍යාපනය පිළිබඳ ඉහළ උපාධියක් ලබා තිබීම ;

*හෝ*

(ආ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය ක්ෂෙත්‍රය පිළිබඳ උපාධියක් ලබා තිබීම සහ විශිෂ්ට හෝ සම්මාන හෝ සාමාර්ථයක් සහිතව පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් හෝ අදාළ විෂය ක්ෂෙත්‍රයෙන් පශ්චාත් උපාධියක් ලබා තිබීම;

*හෝ*

(ඇ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් පළමු හෝ දෙවැනි පංතියේ (ඉහළ) සාමාර්ථයක් සහිතව උපාධියක් හා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් හෝ අදාළ විෂය ක්ෂෙත්‍රයෙන් හෝ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

*සැ. ළ. කි. යු.* : නියමිත දිනට (1995.01.01) අධ්‍යාපන විද්‍යාපීඨයක ස්ථිර කථිකාචාර්යවරයෙක් වශයෙන් හෝ සහාය කථිකාචාර්යවරයෙකු වශයෙන් හෝ වසර (05) පහකට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණකර ඇති වයස අවු. 45 ඉක්මවා සිටින අය ඉහත 5.2 ඡේදයේ අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් තිබීමේ අවශ්‍යතාවයෙන් පමණක් නිදහස් කරනු ලැබේ.

*6.0 වැටුප් පරිමාණය :*

6.1 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 අනුව SL 1-2006 වැටුප් ඛණ්ඩය යටතේ වන රු. 22,935-10x645-8x790-17x1,050-රු. 53,555 (මාසික) වැටුප් පරිමාණය අදාළ වේ.

*7.0 තෝරා ගැනීමේ ක්‍රමය :*

7.1 රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් එම කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ ලකුණු පරිපාටියකට අනුව පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරාගනු ලැබේ.

7.2 *සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ පහත සඳහන් ලිපිලේඛනවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.*

7.2.1 උප්පැන්න සහතිකය (උපකෘත පාසල්වලට ඇතුළත් කිරීමේ නීති යටතේ නිකුත් කර ඇති උප්පැන්න සහතික හෝ බෞතීස්ම සහතිකය හෝ පිළිගනු නොලැබේ.)

7.2.2 උපාධි සහතික සහ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ වෙනත් සහතික.

7.2.3 වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික.

7.2.4 සිංහල, ඉංග්‍රීසි හා දෙමළ භාෂා දැනුම පිළිබඳව ලබා ඇති උසස්ම සහතික.

7.3 පුරප්පාඩු සියල්ලම හෝ කිසියම් සංඛ්‍යාවක් පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

7.4 එක් එක් පුරප්පාඩුව ඇති වූ දිනට පූර්වාසන්න පස් අවුරුදු සේවා කාලය තුළ විනය දඬුවමකට භාජනය නොවීමෙන් හා සියළු වැටුප් වර්ධක උපයාගැනීමෙන් සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.

7.5 සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී අවශ්‍ය ලිපිලේඛන ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

7.6 *ගැසට් නිවේදනයේ* අංක 04 සහ අංක 05 යටතේ සුදුසුකම් සනාථ කිරීමේ සහතිකවල සහ උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපත් අයදුම්පත සමග අමුණා එවිය යුතු ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

උපාලි මාරසිංහ,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2015 මැයි මස 26 වැනි දින.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-I ශ්‍රේණියේ පුරප්පාඩු*

(A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපිටම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කර ගත යුතුය.)

01. (i) ඉල්ලුම් කරන තනතුර :———. (ii) අදාළ විද්‍යාපීඨය :——.
(iii) මාධ්‍යය:————.
(iv) 2-1 ශ්‍රේණියට අයදුම් කිරීම සඳහා ගැසට් නිවේදනයේ 5.0 යටතේ සුදුසුකම් ලබන නිර්ණායක අංකය :————.

02. (i) මුලකුරු සමග නම (සිංහලෙන්) :———.
හිමි/මයා/මිය/මෙය
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) Rev/Mr/Mrs/Miss :———.
(ii) මුලකුරු වලින් හැඳින්වෙන නම :————.

03. (i) රාජකාරි ලිපිනය :————.
(ii) පෞද්ගලික ලිපිනය :————.
(iii) පෞද්ගලික දුරකථන අංකය :————.

04. (i) උපන් දිනය :————.

(ii) ජාතික හැඳුනුම්පත් අංකය :————.

05. පුරවැසිභාවය :————.

(i) පරම්පරාවෙන් ද/ලියාපදිංචි කිරීමෙන් ද යන වග :————.

06. ඔබ අයත් ජන වර්ගය : [ ] (ඉලක්කමෙන්)

(1. සිංහල, 2. දෙමළ 3. වෙනත්)

07. (i) මුල් පත්වීමේ දිනය හා තනතුර :————.
(ii) වර්තමාන තනතුර හා එයට පත්වූ දිනය :————.
(iii) වර්තමාන සේවා ස්ථානය :————.
(iv) ගුරු අධ්‍යාපනඥ සේවයේ 2- II ශ්‍රේණියේ කාර්යක්ෂමතා-කඩඉම සමත්/අසමත් යන්න හා සමත්නම් ප්‍රතිඵල වලංගු දිනය :————.

08. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර :

(i) පළමු උපාධිය :

| *උපාධියේ නම හා නිකුත් කළ ආයතනය* | *වර්ෂය* | *පන්තිය* | *විෂයයන්* |
|---|---|---|---|
| | | | |

(ii) පශ්චාත් උපාධිය :

| *සහතිකයේ නම සහ නිකුත් කළ ආයතනය* | *වර්ෂය* | *පන්තිය* | *විශිෂ්ඨ/සම්මාන /සාමාන්‍ය ද යන වග* |
|---|---|---|---|
| | | | |

(iii) අධ්‍යාපන ඩිප්ලෝමාව :

| සහතිකයේ නම සහ නිකුත් කළ ආයතනය | පාඨමාලාවට ගත වූ කාලය | විශිෂ්ට ද සම්මාන ද යන වග | විෂයයන් පිළිබඳ විස්තරය |
|---|---|---|---|
| | | | |

(iv) වෙනත් වෘත්තීය සුදුසුකම් (ඩිප්ලෝමා සහතික හා පුහුණු ගුරු සහතික පිළිබඳ විස්තර) :

| සහතිකයේ නම සහ නිකුත් කළ ආයතනය | පාඨමාලාවට ගතවූ කාලය | විෂයයන් පිළිබඳ විස්තර |
|---|---|---|
| | | |

(v) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාව :

| අ. පො. ස. (සා/පෙළ) | සාමාන්‍යය/සම්මාන/ අධි සම්මාන | ප්‍රතිඵල වලංගු දිනය |
|---|---|---|
| | | |

| ඉංග්‍රීසි විෂයයට අදාළව ලබා ඇති වෙනත් සහතික | නිකුත් කළ ආයතනය හා වලංගු දිනය | ශ්‍රේණිය |
|---|---|---|
| | | |

09. කිසියම් වරදකට උසාවියක දී ඔබ වරදකරුවෙකු වශයෙන් තීරණයකර තිබේ ද? (එසේ නම් විස්තර සඳහන් කරන්න.) :———.

10. දැනට ඔබට විරුද්ධව දෙපාර්තමේන්තුමය, විනයානුකූල පරීක්ෂණයක් පවත්වන්නේ ද? නැතහොත් අධිකරණය ඉදිරියේ නඩුවක් විභාග වෙමින් පවතී ද? (එසේ නම් විස්තර සඳහන් කරන්න.) :————.

11. මෙම ඉල්ලුම්පතෙහි මා විසින් සඳහන් කර ඇති සියලුම තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි දී ඇති තොරතුරු කිසිවක් අසත්‍ය හෝ සාවද්‍ය බව අනාවරණය වුවහොත් ඒ මත මා මෙම තනතුර ලැබීමට නුසුදුස්සකු බවට තීරණය කරන බවත්, උසස්වීම ලැබීමෙන් පසු මෙහි සඳහන් තොරතුරු කිසිවක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව අනාවරණය වුවහොත් මා කිසිම වන්දියක් නොලබා තනතුරින් පහකිරීමට යටත්වන බව ද දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

.................................. ගේ ඉල්ලුම්පත ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම ආයතනයේ ................. වශයෙන් සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් හිමි/ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
ආයතන ප්‍රධානියා හෝ
එම ප්‍රධානියා වෙනුවට බලය ලබා
ඇති නිලධාරියාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.
ආයතනය :————.

***ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-II ශ්‍රේණියේ නිලධාරීන් 2-I ශ්‍රේණියට උසස් කිරීමේ ලකුණු පරිපාටිය***

ලකුණු ලබාදීම සඳහා අදාළ සුදුසුකම් පුරප්පාඩුව ඇති වූ දිනට පෙර සපුරා තිබිය යුතු ය.

1.0 සේවා පළපුරුද්ද — උපරිම ලකුණු 50

ශ්‍රී. ලං. ගු. අ. සේ. 2-II ශ්‍රේණියේ වසර 05ට වැඩි අමතර සක්‍රීය සේවා කාලය සඳහා එක් වසරකට ලකුණු 10 බැගින් උපරිම වසර 05ක් සඳහා ලබාදෙනු ලැබේ.

2.0 අතිරේක අධ්‍යාපන සුදුසුකම් — උපරිම ලකුණු 20

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-I ට ඉල්ලුම් කිරීමට අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් වලට අමතරව ඇති සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| 2.1 | උපාධිය | 05 |
| 2.2 | පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 10 |
| 2.3. | පශ්චාත් උපාධිය | 15 |
| 2.4 | ආචාර්ය උපාධිය | 20 |

03. ශාස්ත්‍රීය කාර්ය සාධනය — උපරිම ලකුණු 10

උපාධි, පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ පශ්චාත් උපාධියට ඉදිරිපත් කරන ලද ලේඛන සඳහා ලකුණු ලබා දෙනු නොලැබෙන අතර එක් ප්‍රකාශනයක් සහ එක් පර්යේෂණයක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| 3.1. | පර්යේෂණ | |
| 3.1.1. | විධිමත්ව සැකසූ පර්යේෂණ වාර්තාව (අවසන් වාර්තාව) | 02 |
| 3.1.2 | රැකියා ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණයක් වීම | 01 |
| 3.1.3 | ප්‍රසිද්ධ පර්යේෂණ සාකච්ඡා මණ්ඩපයකට ඉදිරිපත් කර තිබීම | 02 |
| 3.2. | ප්‍රකාශන | |
| 3.2.1 | විෂයානුබද්ධ ප්‍රකාශන (පුවත්පත් වාර සඟරා ආදියේ ප්‍රසිද්ධියට පත් කළ) | 03 |
| 3.2.2. | විෂයානුබද්ධ පොත් පළ කිරීම | 02 |

04. තොරතුරු තාක්‍ෂණ හැකියාව උපරිම ලකුණු 10
(රජයේ පිළිගත් ආයතනයකින් ලබා ගත් සහතික සඳහා පමණක් ලකුණු හිමි වේ.)

4.1 මාස 06ට හෝ ඊට වැඩි තොරතුරු තාක්‍ෂණ ඩිප්ලෝමා පාඨමාලාවන් සඳහා 05
4.2 වසර 01ක් හෝ වසර 1ට වැඩි තොරතුරු තාක්‍ෂණ ඩිප්ලෝමා සඳහා 10

05. භාෂා දැනුම උපරිම ලකුණු 10

(රජයේ පිළිගත් ආයතනයකින් ලබා ගත් සහතික සඳහා පමණක් ලකුණු හිමිවේ.)

ඉංග්‍රීසි භාෂාව

5.1 මාස 06ක් හෝ ඊට වැඩි කාලයක ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාවක් සඳහා 05
5.2 වසර 01 හෝ වසර 01ට වැඩි කාලයක ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාවක් සඳහා 10

මුළු ලකුණු 100

06-261

---

## ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව

### සහකාර පොලිස් අධිකාරී තනතුරට ඉඳුරාම බඳවාගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2015

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ ඉහත තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් (පිරිමි) අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *විභාගය* :

2.1 ඉහත තරග විභාගය සඳහා වන ලිඛිත පරීක්ෂණය 2015 වර්ෂය තුළ, කොළඹ දිස්ත්‍රික්කයේ දී පමණක් පැවැත්වීමට කටයුතු කරන අතර, විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ඇත.

2.2 පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

2.3 මහජන යහපත උදෙසා ඇබෑර්තු පිරවිය යුතු නොවේ යැයි රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කළහොත් මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ හැකිය.

03. *සුදුසුකම්* :

3.1 අධ්‍යාපන සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් උපාධියක් ලබා තිබිය යුතු ය.

3.2 කායික සුදුසුකම් :

3.2.1 දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා සහ තනතුරේ රාජකාරි ඉටුකිරීම සඳහා සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

3.2.2 උස අඩි 5යි, අඟල් 06ක් හෝ වැඩිවිය යුතු ය.

3.2.3 දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවන් : උපැස් යුවළක් හෝ ස්පර්ශ කාච රහිතව ඇස් පෙනීම අවම වශයෙන් 6/6 සහ 6/12 අතර ද, වර්ණ පෙනීම සාමාන්‍යය ද විය යුතු ය.

3.3 වෙනත් සුදුසුකම් :

3.3.1 ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය.

3.3.2 අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

3.3.3 අවිවාහකයකු විය යුතු ය. (දික්කසාද වූවන් සහ වැන්දඹුවන් විවාහකයින්සේ සලකනු ලැබේ).

3.3.4 දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

3.3.5 තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය ඡේද 3.1 සිට 3.4.2 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළයුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

3.4 වයස :

3.4.1 අවම සීමාව : අවුරුදු 22යි.

3.4.2 උපරිම සීමාව : අවුරුදු 28යි. (පොලිස් සේවයේ නියුතු, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ආයතනයකින් ලබාගත් උපාධියක් සහිත නිලධාරීන් සඳහා වයස් සීමාව අවුරුදු 30යි).

04. පත්කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

05. සේවා ගණය පිළිබඳ විස්තර :

5.1 සේවා ගණය : විධායක සේවා ගණය

5.2 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය .- නීතිය ක්‍රියාත්මක කිරීම හා ආරක්ෂා කිරීම, ව්‍යවස්ථාදායකය මගින් පනවන නීති හා අණපනත් ක්‍රියාත්මක කිරීම, අධිකරණ කාර්යයන් සඳහා සහයවීම, කළමනාකරණය හා මහජන මිත්‍රශීලීත්වයෙන් යුත් පොලිස් සේවයේ අභිමානය සුරකීම හා ආරක්ෂක කාර්යයන් ඉටුකිරීම.

5.3 කාර්යයන් පැවරීම : දරන තනතුරට අනුව කාර්යයන් පැවරීම සිදුකෙරේ.

06. තනතුරෙහි ස්වභාවය : ස්ථිර විශ්‍රාම වැටුප් සහිත.

07. වැටුප් :

7.1 වැටුප් කේත අංකය : එස්එල් 1-2006

7.2 වැටුප් පරිමාණය : රු. 22,935 - 10 x 645 - 8 x 790 - 17 x 1,050 - 53,555

සටහන.— සහකාර පොලිස් අධිකාරී තනතුරට බඳවාගනු ලබන නිලධාරීන් වැටුප් ක්‍රමයේ ආරම්භක වැටුප් පියවරේ පිහිටවනු ලැබේ. වැටුප් වර්ධක උපයාගැනීම මත වැටුප් ක්‍රමයේම අඛණ්ඩව වැටුප් වර්ධක ලබාදෙනු ලැබේ.

08. පත්වීමේ කොන්දේසි :

08.1 මෙම පත්වීම ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

09. සේවා කොන්දේසි :

09.1 ඉඳුරාම බඳවාගන්නා නිලධාරීන් තුන් අවුරුදු ආධුනික කාලයකට යටත්වනු ඇත.

09.2 තෝරාගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් සම්පාදිතව පවත්නා සහ මින් මතු ඒ සම්බන්ධයෙන් සම්පාදනය කරනු ලබන කිසියම් නියෝග වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතුයි.

09.3 ආයතන සංග්‍රහයේ විධි විධාන, මුදල් රෙගුලාසි, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ, දෙපාර්තමේන්තු චක්‍රලේඛ, දෙපාර්තමේන්තු අත්පොත්වල සහ උපදෙස් සංග්‍රහවල විධි විධානවලට ද යටත්විය යුතුයි.

09.4 ආධුනික කාලය පත්වීමේ දින සිට මුල් වසර 03ක් සඳහා බලපැවැත්වෙන අතර, එම කාලය තුළ දී නිලධාරියා හට විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එම කාලය තුළ විවාහ විය හැක්කේ පොලිස්පතිගේ විශේෂ අවසරය මත පමණි. මෙම රෙගුලාසිය උල්ලංඝනය කළහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

09.5 ඉඳුරාම බඳවාගන්නා අයදුම්කරුවන් පත්කරනු ලැබූ දින සිට අවුරුදු 03ක ආධුනික කාලයක් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කළ යුතු අතර, මෙම ආධුනික කාලය අවසන්වීමට පෙර යම් නිලධාරියෙකු තනතුරෙන් ඉල්ලා අස්වීමට අදහස් කරන්නේ නම් ඔහුගේ පුහුණුව සහ නිල ඇඳුම් ඇතුලු අනෙකුත් වියදම් වෙනුවෙනුත් නියම කරනු ලබන මුදලක් වෙතොත් ඒවා සියල්ල ඉල්ලා අස්වීමේ ලිපිය භාරදෙන අවස්ථාවේදීම ගෙවීමට කැමැත්ත පළකිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතු ය. ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධි විධානයන්ට යටත්ව කටයුතු කරනු ලැබේ.

09.6 පත්වීම භාර ගැනීමට සුදුසුකම් ලබන්නන් පත්වීම භාර ගැනීමට ප්‍රථම සියලු ණය බැඳීම්වලින් නිදහස් වී සිටිය යුතුයි.

09.7 ඉඳුරාම බඳවාගන්නා සහකාර පොලිස් අධිකාරිවරුන් පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පුහුණුව ආරම්භ කළ වහාම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව, පොලිස්පති චක්‍රලේඛ අංක 1693/2003 සහ 1804/2004ට අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතුයි.

10. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි.

10.1 සියලුම අයදුම්කරුවන් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි, ආයතන සංග්‍රහයේ පළමු වන සහ දෙවන වෙලුමේ විධි විධාන හා ඊට පරිබාහිර වන්නාවූ චක්‍රලේඛ හා කොන්දේසි, පොලිස් දෙපාර්තමේන්තුවේ නියෝග, පොලිස්පති චක්‍රලේඛ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ සහ මුදල් රෙගුලාසි විධි විධානවලට යටත් වේ.

10.2 සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධි විධාන අදාළ වේ.

11. බඳවා ගැනීමේ ක්‍රමය :

විවෘත තරග විභාගයෙන් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව විවෘත තරග විභාගය පවත්වනු ලැබේ. විවෘත තරග විභාගයේ දී සියලුම විෂයයන් සමත් අයදුම්කරුවන් අතරින් බඳවාගැනීමට නියමිත සංඛ්‍යාව මෙන් පස්ගුණයක අයදුම්කරුවන් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එසේ ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවල දී සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සහ විවෘත තරග විභාගයේ දී ලබාගන්නා ලකුණුවල එකතුවෙහි කුසලතා අනුපිළිවෙල සහ පසුබිම් පරීක්ෂණයේ දී යහපත් වාර්තා ඇති අයදුම්කරුවන් සහ වෛද්‍ය පරීක්ෂණය සමත් අයදුම්කරුවන් පුරප්පාඩු සඳහා බඳවාගනු ලැබේ.

11.1 විවෘත තරග විභාගය

11.1.1 විභාගයේ නම : සහකාර පොලිස් අධිකාරී තනතුරට ඉඳුරාම බඳවාගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2015

11.1.2 විභාගය පිළිබඳ විස්තර

| *අනු. අංකය* | *ප්‍රශ්න පත්‍රය/ විෂය ක්ෂේත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| 1. | බුද්ධි පරීක්ෂණය | පැය 01යි | 100 | 40% |
| 2. | සාමාන්‍ය දැනීම | පැය 01යි | 100 | 40% |
| 3. | භාෂා ප්‍රවීණතාව | පැය 02යි | 100 | 40% |

11.1.3 පවත්වනු ලබන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල්

11.1.4 විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | ප්‍රශ්න 60ක් දෙනු ලැබේ. බහුවරණ මාදිලියේ සහ කෙටි පිළිතුරු මාදලියේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. |

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 2. සාමාන්‍යය දැනුම | ප්‍රශ්න 50ක් දෙනු ලැබේ. බහුවරණ මාදිලියේ සහ කෙටි පිළිතුරු මාදලියේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. |
| 3. භාෂා ප්‍රවීණතාව | වාක්‍ය රචනය, සාරාංශකරණය, දී ඇති ඡේදයක් කියවා පිළිතුරු සැපයීම. දී ඇති පාඨයට වඩාත් ගැළපෙන ප්‍රකාශය තෝරා ලිවීම ආදියෙන් සමන්විත ය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. |

11.1.5 විභාග මාධ්‍යය :-

11.1.5.1 විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ.

11.1.5.2. අයදුම්කරුවෙකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම් ලත් විභාගයෙන් සාමාර්ථය ලක් භාෂාවෙන්ම හෝ රාජ්‍ය භාෂාවෙන් විය යුතු ය.

11.1.5.3 අයදුම්කරුවෙකු, සුදුසුකම් ලත් විභාගයේ විෂයයන් භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත් වී ඇත්නම්, එම විභාගයේ දී ඔහු සමත් වූ විෂයයන්ගෙන් වැඩි ගණනකට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් විභාගයට පෙනී සිටිය යුතු ය.

11.1.5.4 ප්‍රධාන විෂය එක භාෂාවකිනුත්, අතිරේක විෂය තවත් භාෂාවකිනුත් සමත් වී ඇති විශේෂ උපාධියක් ඇති අයදුම්කරුවෙකු ප්‍රධාන විෂයයෙන් සාමාර්ථය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතු ය.

සටහන :

(i) ඉහත 11.1.5.2 සිට 11.1.5.4 හි සුදුසුකම් ලත් විභාගය යන පදයෙන් අදහන් කෙරෙන්නේ 11.1.1. ඡේදයේ සඳහන් විභාගය වේ.
(ii) අයදුම්කරුවෙකු විභාගයේ දි පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතු ය.
(iii) තම අයදුම් පත්‍රයෙහි සඳහන් භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අයදුම්කරුට ඉඩ දෙනු නොලැබේ.

11.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 |
| 2. භාෂා ප්‍රවීණතාව | 10 |
| 3. පරිගණක හැකියාව | 05 |
| 4. ක්‍රීඩා කුසලතා | 20 |
| 5. නායකත්වය/ප්‍රජා සේවාවන් | 20 |
| 6. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම | 20 |
| එකතුව | 100 |

11.2.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන අවස්ථාවේදීම සුදුසුකම් පරීක්ෂා කිරීම ද සිදු කෙරේ.

11.2.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා ලකුණු සංඛ්‍යාව විවෘත තරග විභාගයෙන් ලබාගන්නා ලද ලකුණු සංඛ්‍යාව සමග එකතු කොට අයදුම්කරු ලබාගත් මුලු ලකුණු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

11.2.3 අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දැනුම් දීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි සිදුකරනු ඇත.

12. පසුබිම් පරීක්ෂණය :-

12.1 ඉහත පරිදි බඳවාගැනීමට සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් සම්බන්ධයෙන් යහපත් චරිතය තහවුරුකර ගැනීම සඳහා පසුබිම් පරීක්ෂණ්‍ය පවත්වනු ලබයි.

*සටහන.*— සමීප ඥාතීන් සම්බන්ධයෙන් බරපතල ගනයේ අපරාධ වාර්තා කිසිවක් නොතිබිය යුතු ය.

12.2 අයදුම්කරුවන් යහපත් චරිතය තහවුරු කරගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ගේ ද, ඔහු සමීපව ඇසුරු කරන්නන්ගේ ද, යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර, අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවාගනු නොලැබේ.

*සටහන.*—අයදුම්කරුගේ මව, පියා, භාරකරුවන්, සහෝදරයන් සහ සහෝදරියන් සමීප ඥාතීන් ලෙස සලකනු ලබයි.

12.3 බඳවාගැනීමේ දි අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම, ඔහු බඳවාගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව බඳවාගැනීමෙන් පසුව හෙළිවුවහොත් ඕනෑම අවස්ථාවක දී, පත්වීම අවසන් කරනු ලැබේ.

13. වෛද්‍ය පරීක්ෂණය :-

13.1 වෛද්‍ය පරීක්ෂණය සඳහා තෝරාගත් අයදුම්කරුවන් පොලිස් රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී විසින් පවත්වනු ලබන වෛදය පරීක්ෂණයෙන් සමත්විය යුතු ය. තව ද මෙහි දී අයදුම්කරුවන් පොලිස් රාජකාරි සඳහා සුදුසු බවට ශාරීරික හා මානසික යෝග්‍යතා පරීක්ෂණයකට ද, භාජනය කරනු ලැබේ. ප්‍රධාන වෛද්‍ය නිලධාරි විසින් වෛද්‍ය පරීක්ෂණයේ වාර්තා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 169 වෙනි පොදු පෝර්මය යටතේ ඉදිරිපත් කළ යුතු ය. වෛද්‍ය පරීක්ෂණයට භාජනය විය හැක්කේ එක් වරක් පමණි.

14. පුහුණුවට කැඳවීම.—ඉදුරාම බඳවාගැනීමේ පසුබිම් පරීක්ෂණයෙන් සහ වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් අතරින් කුසලතා ලේඛනයට අනුව උපරිම ලකුණු ලබාගෙන ඇති අයවලුන් අනුමත පුරප්පාඩු සංඛ්‍යාව අනුව පොලිස්පති විසින් නියම කරන ලද දිනයක දී පුහුණුව සඳහා කැඳවනු ලැබේ. මෙම පුහුණුව ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ දී ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ දී හා ප්‍රාදේශීය වශයෙන් ලබාදෙනු ලැබේ.

සුදුසුකම් ලබන නිලධාරීන් සඳහා සේවා ආරම්භක පුහුණුවක් ලබාදෙනු ලැබේ. අසුන්පිට යාම ද පුහුණුව සඳහා ඇතුළත් වේ.

15. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

15.1 අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් ඒ 4 ප්‍රමාණයේ කඩදාසි දෙකක සකස් කර අයදුම්කරු විසින්ම පිරවිය යුතු ය. 01 සිට 08 තෙක් වන ශීර්ෂ අයදුම්පත් කඩදාසියේ පළමුවැනි පැත්තේ ද, 09 සිට 14 තෙක් ශීර්ෂ දෙවන පිටුවේ ද 15 සිට ශීර්ෂ අවසන් පිටුවේ ද වන පරිද්දෙන් තම අයදුම්පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතු ය.

15.2 අයදුම්පත්‍රය අයදුම්කරු විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂාවෙන් පිරවිය යුතු ය.

15.3 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2015.08.13 වැනි දින හෝ එදිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් අධ්‍යක්ෂ, ආධුනිකයන් බඳවාගන්නා කාර්යාලය, අංක 375, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06 යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ සහකාර පොලිස් අධිකාරි තනතුරට ඉසුරාම බඳවාගැනීම සඳහා වන විවෘත තරග විභාගය 2015" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය. මෙදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පතක් භාර ගනු නොලැබේ.

15.4 සෑම ආකාරයකින්ම සම්පූර්ණ නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාදවීම හෝ සම්බන්ධව කෙරෙන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

16. ගාස්තු :-

16.1 විභාග ගාස්තුව රුපියල් 1,000කි.

16.2 මෙම ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13ට බැර කරන ලෙසට උපදෙස් සහිතව අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ප්‍රථම දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් පමණක් ගෙවිය යුතු ය. තැපැල්/ උප තැපැල් කාර්යාලයෙන් ලබාගත් ලදුපත් කුවිතාන්සි ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතු ය. අයදුම්පත්‍රයේ හා ලදුපතේ ඡායා පිටපතක් ලග තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

16.3 මෙම ගාස්තුව සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ.

17. අයදුම්පත් භාර ගැනීම :

17.1 අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ

17.2 මෙම අයදුම්පත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලබන අතර, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. අයදුම්කරුවන් විසින් තමන්ගේ ප්‍රවේශ පත්‍ර අත්සන සහතික කරවාගෙන විභාග මධ්‍යස්ථානය භාර ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ කිරීමට අසමත් වන අයදුම්කරුවන්ට මෙම විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

17.3 අයදුම්කරුවන් තමන් සඳහා නියම කර තිබෙන විභාග ශාලාවෙහිම විභාගයට පෙනී සිටිය යුතු ය. තමන්ට නියමිත විභාග ශාලාව හැර වෙනත් විභාග ශාලාවක දී කිසිම විභාග අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපෙක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝණය කළහොත් විභාග කොමසාරිස් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට සිදුවනු ඇත.

17.4 නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළකරනු ඇත. නිවේදනයේ සඳහන්, විභාග පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 05කටවත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවෙකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා අයදුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කල යුතු ය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපත් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින් විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ලග තබාගත් අයදුම් පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

17.5 විභාගය සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම සුදුසුකම් පිළිගැනීමක් ලෙසට අදහස් නොකෙරේ.

18. අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීම :

18.1 දැනට රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගේ අත්සන් සහතික කළ යුත්තේ, ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලය ලත් නිලධාරියෙකු හෝ විසිනි.

18.2 අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන් සහිතක කළ යුත්තේ, එසේ කිරීමට බලයලත් කෙනෙකු විසිනි. එනම් සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු, රජයේ පාසලක විදුහල්පතිවරයෙකු, නාවික, ගුවන් හෝ යුධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියෙකු හෝ රු. 240,360ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු විසිනි.

19. අයදුම්කරුවන්ගේ අනන්‍යතාව : අයදුම්කරු විසින් තමන් පෙනී සිටින එක් එක් විෂයයන්හි දී, විභාග ශාලාවේ දී ශාලාධිපති සෑහීමට හේතු වන පරිදි තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලේඛනවලින් එකක් පිළිගනු ඇත.

19.1 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ජාතික හැඳුනුම්පත;

19.2 වලංගු ගමන් බලපත්‍රයක්.

20. *වැරදි තොරතුරු සැපයීම පිළිබඳ දඬුවම් .-* මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව, කිසියම් අයදුම්කරුවෙකු එයට පෙනී සිටීමට නුසුදුසු යැයි පෙනී ගියහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු කවර අවස්ථාවකදී වුවද ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය. අයදුම්කරු විසින් සපයන ලද තොරතුරු කිසිවක් වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු විසින් උවමනාවෙන්ම කිසියම් වැදගත් කාරණයක් වසන් කරන ලද නම් හෝ බඳවා ගැනීමෙන් පසු ඔහු රජයේ සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වනු ඇත.

21. *ලියකියවිලි .-* මතු දැක්වෙන මුල් ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස නියම කළ විට අයදුම්කරු විසින් ඒවා ඉදිරිපත් කළ යුතු වේ.

21.1 උප්පැන්න සහතික පත්‍රය (පාඨශාලාවල භාවිතය සඳහා නිකුත් කරන ලද සහතිකය හෝ බෞතීස්ම සහතිකය හෝ මේ සඳහා පිළිගනු නොලැබේ.)

21.2 අධ්‍යාපන සුදුසුකම් හා ප්‍රායෝගික පළපුරුද්ද පිළිබඳ සහතික පත්‍ර.

21.3 පාසැල්වලින් ලබාගෙන ඇති සහතික ද ඇතුලුව චරිත සහතික 04කට නොවැඩි ගණනක් එම සහතික අතුරින් අඩු වශයෙන් එකක්වත් තම අධ්‍යයන උපදේශකවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් හෝ ලබා ගත් එකක් විය යුතුය.

21.4 පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සහතික කරන ලද මාස 06කට නොඅඩු කාල සීමාවක් තුළ ලබා ගත් ග්‍රාම නිලධාරී සහතිකය.

22. *අයථා අනුග්‍රහයන් .-* යම් අයදුම්කරුවෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවද අයථා අනුග්‍රහයන් ලබා ගැනීමට හෝ බලපෑමකට හෝ උත්සහායක් දැරීම එම අයදුම්කරු නුසුදුස්සෙකු වීමට හේතු වනු ඇත.

23. කාර්යක්ෂමතා කඩඉම

23.1 ඉඳුරාම බඳවාගත් අයවලුන් තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර ලිඛිත, වාචික සහ ප්‍රායෝගික කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා පෙනී සිට ඉන් සමත්විය යුතුය.

24. භාෂා ප්‍රවීණතාව

24.1 රාජ්‍ය භාෂාව :
රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 01/2014 හා ඊට අනුෂංගික චක්‍රලේඛවලට නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ආධුනික කාලය තුළ ලබාගත යුතුය.

24.2 අනෙක් රාජ්‍ය භාෂාව :
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව අදාල මට්ටමේ ප්‍රවීණතාව ලබාගත යුතුය.

25. ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ සහකාර පොලිස් අධිකාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ විධි විධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

26. සිංහල දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම ගැසට් නිවේදනයේ භාෂා පාඨ අතර, කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි.

එන්. කේ. ඉලංගකෝන්,
පොලිස්පති,
පොලිස් මූලස්ථානය.

2015 මැයි මස 25 වැනි දින,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

ආදර්ශ අයදුම් පත්‍රය

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ සහකාර පොලිස් අධිකාරී තනතුරට ඉඳුරාම බඳවාගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2015

Open Competitive Examination for Direct Recruitment to the Sri Lanka Police as Assistant Superintendent of Police - 2015

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල 2, දෙමළ 3, ඉංග්‍රීසි 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. නම :

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් උදා. PERERA A.B.)

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. ලිපිනය :

2.1 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

2.2 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

2.3 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

03. 3.1 ජාතික හැඳුනුම්පත් අංකය :

3.2 නිකුත් කල දිනය :

04. ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ 0
ස්ත්‍රී 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. උපන් දිනය ඃ

වර්ෂය ඃ ☐☐☐☐ මාසය ඃ ☐☐ දිනය ඃ ☐☐

(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)

2015.08.13 දිනට වයස ඃ

අවු. ඃ ☐☐ මාස ඃ ☐☐ දින ඃ ☐☐

07. ජන වර්ගය ඃ

සිංහල - 2, දෙමළ - 3, ඉන්දියානු දෙමළ - 4,
මුස්ලිම් - 5, වෙනත් - 6.
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) ☐

08. විවාහක/අවිවාහක බව ඃ
විවාහකයි 1, අවිවාහකයි 2,
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) ☐

09. පදිංචිය පිළිබඳ විස්තර ඃ

9.1 ස්ථිර පදිංචියට අදාළ පොලිස් වසම :—————.
9.2 ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරි කොට්ඨාසය වසම :—————.
9.3 ස්ථිර ලිපිනයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :—————.
9.4 රාජකාරි ලිපිනය (අදාළ නම් පමණි) :—————.

10. 10.1 උපාධිය ලද දිනය :—————.
10.2 විශ්ව විද්‍යාලය/ආයතනය :—————.
10.3 ලියාපදිංචි වූ අංකය හා දිනය :—————.
10.4 බාහිර/අභ්‍යන්තර :—————.
10.5 උපාධිය :—————.
(උපාධි සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)
10.6 විෂයයන් :—————.
10.7 පන්තිය :—————.
10.8 ඉහළ/පහළ :—————.
10.9 විභාග අංකය :—————.
10.10 විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :—————.

11. ශාරීරික සුදුසුකම් ඃ

උස - අඩි :—————. අඟල් :—————.

12. ඔබ දැනට පොලිස් නිලධාරියෙකු වශයෙන් පත්වීම් උසුලන්නේද ? :—————.

එසේ නම් දැනට දරන තනතුර හා පත්වීම ලැබූ දිනය සඳහන් කරන්න. :—————.

13. මුදල් කුවිතාන්සිය/ලදුපත මනා ලෙස අලවන්න. කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න.

| (ලදුපත නොගැලවෙන පරිදි එහි එක් දාරයකින් මෙහි අලවන්න) |
|---|

14. *අයදුම්කරුගේ සහතිකය ඃ*

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, ......................................තැපැල්/උප තැපැල් කාර්යාලය වෙත විභාග ගාස්තු ගෙවන ලද අංක ................................හා .............................වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාග නීතිරීති වලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (ගැසට් නිවේදනයේ 18 වෙනි ඡේදය පරිදි විය යුතුය)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන .................................... (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහුගේ අත්සන ................................දින මා ඉදිරියේදී තැබූ බවත්. නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම මුදල් කුවිතාන්සිය/ලදුපත අලවා ඇති බවත්, මම සහතික කරමි.

—————,
(අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන)

දිනය :—————.
අත්සන සහතික කරන අයගේ සම්පූර්ණ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
(නිල මුද්‍රාව තබන්න)

16. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අදාළ නම් පමණි)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ................................................මයා ..........................................දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ/මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත් ඔහු මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

—————,
(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

තනතුර :—————.
දිනය :—————.
(නිල මුද්‍රාව තබන්න)

06 - 265

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**අධ්‍යාපන අමාත්‍යාංශය**

## ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2 වන පන්තියේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2015

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2 වන පන්තියේ II වන ශ්‍රේණියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2015 සැප්තැම්බර් මස කොළඹ දී පැවැත්වේ.

02. මෙම විභාගයට අදාළ විෂය නිර්දේශය හා අනිකුත් විධිවිධාන අංක 1070/13, 1999 මාර්තු මස 11 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇත. පහසුව සඳහා එම විෂය නිර්දේශය හා අනිකුත් විධිවිධාන පහත දක්වා ඇත.

නිලධාරියකු මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට නියමිත විෂයයන් සඳහා එකම වතාවක දී හෝ වෙන වෙනම අවස්ථාවලදී හෝ පෙනී සිටිය හැක.

(අ) *විෂය නිර්දේශය* :

| *විෂය අංකය* | *විෂයය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| 01 | *සාමාන්‍ය කළමනාකරණය හා ආයතන කටයුතු*<br>රජයේ ආයතන සංග්‍රහයේ i, ii, iii, iv, v, vii, viii, ix, xii, xiii, xiv, xxiv, xxviii, xxx සහ xxxi යන පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව ආයතන සංග්‍රහයේ නීති | 100 යි | පැය 1 1/2 |
| 02. | *මුදල් රෙගුලාසි*<br>රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 1 වැනි කොටසේ, i, ii, v, viii, xii හා xiv පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව | 100 යි | පැය 1 1/2 |
| | අධ්‍යාපන නීතිය | 100 යි | පැය 02 |
| 03. | අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් ආඥාපනත් හා පාර්ලිමේන්තු පනත් පිළිබඳව දැනුමක් අපේක්ෂා කෙරේ | | |

(i) 1939 අංක 31 දරන අධ්‍යාපන ආඥා පනත හා ඒ යටතේ පනවන ලද රෙගුලාසි
(ii) 1960 අංක 05 දරන උපකෘත පාඨශාලා සහ ගුරු විද්‍යාල (විශේෂ විධිවිධාන) පනත
(iii) 1961 අංක 08 දරන උපකෘත පාඨශාලා සහ ගුරු විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනත
(iv) 1976 අංක 15 දරන ප්‍රසිද්ධ විභාග (සංශෝධන) පනතින් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත
(v) 1981 අංක 65 දරන උපකෘත පාඨශාලා (විශේෂ විධිවිධාන) පනත
(vi) 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනත
(vii) 1986 අංක 30 දරන අධ්‍යාපනික විද්‍යායතන පනත
(viii) 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත
(ix) 1997 අංක 32 දරන ජාතික ගුරු අධ්‍යාපන අධිකාරිය පනත
(x) 13 වන සංශෝධනයට හා මූලික අයිතිවාසිකම් පිළිබඳ 3 වන පරිච්ඡේදයට විශේෂ අවධානය ඇතිව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
(xi) අධ්‍යාපනයට අදාළව පළාත් සභා විසින් පනවා ඇති ප්‍රඥප්ති

සැ. යු.- අපේක්ෂකයින් කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා යටත් පිරිසෙයින් 40% ක් බැගින් වූ ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

03. *විභාගයේ භාෂා මාධ්‍යය* :

(i) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ii) තරඟ විභාගයක් මගින් රාජ්‍ය සේවයට ඇතුලු වූ අපේක්ෂකයෙකු නම් මෙම විභාගයේ භාෂා මාධ්‍යය ලෙස තරඟ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය ද, තරඟ විභාගයක් නොමැතිව රාජ්‍ය සේවයට ඇතුළු වූ අපේක්ෂකයෙකු නම් මෙම විභාගයේ භාෂා මාධ්‍යය ලෙස රජයේ සේවයට ඇතුළුවීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයද තෝරා ගත යුතු ය.

04. අපේක්ෂකයෙකු තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටින බැව් හෙලිවුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

05. ඉල්ලුම්පත්‍රය මෙහි දැක්වෙන ආකෘති පත්‍රයට අනුව ඉල්ලුම්පත්‍රයේ සියලුම ශීර්ෂයන් පළමුවැනි පිටුවට වන ලෙස ගෙන සකසා ඉදිරිපත් කළ යුතුය. ඉල්ලුම්පත්‍රය පිළියෙල කිරීමේ දී එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.

06. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී පවත්වනු ලබන අතර විභාගය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීතිරීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති.

07. ඉල්ලුම්පත්‍ර 2015 වර්ෂයේ ජූලි මස 10 වැනි දින හෝ ඊට පෙර "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, .තැපැල් පෙට්ටිය 1503, කොළඹ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසුව එවනු ලබන කවරක් හෝ ඉල්ලුම්පත්‍රයක් වුවද ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ" ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-II කාර්යක්ෂමතා කඩඉම් විභාගය" යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

08. නිවේදනයේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන් විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 03 කටවත් පෙර තම ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ හා විභාග ගාස්තු ගෙවූයේ නම් එම මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත ද, අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් කරන ලද ඔබගේ ඉල්ලීම් ලිපිය ද, ෆැක්ස් මගින් යොමු කොට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

09. ඉහත 08 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන පැමිණිලි සලකා බලනු නොලැබේ.

10. අයදුම්පත්‍රයේ ද විභාග සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද, අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කරවා ගත යුතුය. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන කිසිඳු අයදුම්කරුවෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

11. විභාග ශාලාවේදී තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වන අතර ඒ සඳහා පහත සඳහන් ලියවිලි අතරින් කුමක් වුවත් වලංගු වේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

12. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය.

13. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු ගෙවිය යුතුය.

(i) පළමු වතාවට විභාගයට පෙනී සිටින අයගෙන් සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.
(ii) විභාගයට පෙනී සිටින්නන් පළමු වතාවට නොවන විට පහත සඳහන් පරිදි විභාග ගාස්තු අය කෙරේ.

| | |
|---|---|
| සම්පූර්ණ විභාගය සඳහා ගාස්තුව | රු. 500 කි |
| එක් විෂයයකට | රු. 200 කි |

විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල් ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත එහි එක් දාරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැළවෙන ලෙස ඇලවිය යුතුය. තවද එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ. විභාග ගාස්තුව සඳහා මුදල් ඇනවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් කරනු නොලැබේ.

14. විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුලත් ලේඛනයක් ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් ලබා දෙනු ඇත.

15. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතීනම්, එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සළකා කටයුතු කරනු ලැබේ.

16. මෙම විභාග නිවේදනය මගින් විධිවිධාන සළසා නොමැති කවර කරුණක් පිළිබඳ වුව ද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

උපාලි මාරසිංහ,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2015 මැයි මස 27 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

## ඉල්ලුම්පත්‍රය

### ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2 වන පන්තියේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම්විභාගය - 2015
### Efficiency Bar Examination in Class 2 Grade II of Sri Lanka Teacher Educators' Service - 2015

ඉල්ලුම්පත්‍ර "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැපැල් පෙට්ටිය 1503, කොළඹ" යන ලිපිනයට ආයතන ප්‍රධානියා මගින් ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු ය. (විභාගයේ නම කවරයේ වමත් පස ඉහළ කෙළවරේ දැක්විය යුතු ය.) නිලධාරියා විභාගයට පෙනී සිටින මාධ්‍යය :-

සිංහල - 2
දෙමළ - 3 [ ]
ඉංග්‍රීසි - 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. (අ) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා :- GUNAWARDHANA, M. G. B. S. K.

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

02. උපන් දිනය : වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

03. (අ) පදවි නාමය :————.

(ආ) සේවය කරන විද්‍යාපීඨය/ගුරු විද්‍යාලය/ගුරු මධ්‍යස්ථානය හා ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට එවනු ලැබේ) :————.

04. පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

05. නිවේදනයේ දෙවන ඡේදයේ (අ) යටතේ දක්වා ඇති විෂය අංකය හා විෂය සහිතව ගන්නා විෂයයන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

| විෂයය අංකය | විෂයයේ නම |
|---|---|
| | |
| | |
| | |

06. මීට ප්‍රථම මෙම විභාගයට සම්පූර්ණ ලෙස හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටියේ ද එසේ නම් එම විෂයයන් හා පෙනී සිටි වර්ෂය හා මාධ්‍යය සඳහන් කරන්න.

| විෂයය | වර්ෂය | මාධ්‍යය | විභාග අංකය |
|---|---|---|---|
| | | | |
| | | | |

07. ගෙවන ලද විභාග ගාස්තුව :-

(විභාග ගාස්තු ගෙවා ලදුපත මෙහි අලවන්න)

08. ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ගැසට් නිවේදනයේ 03 වන ඡේදයට අනුව දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

විභාග කොමසාරිස් ජනරාල්,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

ඉදිරිපත් කරමි.

ඉහත විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ගැසට් නිවේදනයේ 03 වැනි ඡේදයට අනුව ඔහු/ඇය දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් මම සහතික කරමි. අපේක්ෂකයා/අපේක්ෂිකාව නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

පීඨාධිපතිගේ/ගුරු විදුහල්පතිගේ/
මධ්‍යස්ථානාධිපතිගේ අත්සන හා පදවි නාමය

06-390

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය**

නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය

**ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා - 2015**

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදාරා මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ නිපුනයෙකු වන්න.**

**පාසල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණ කාලීන NVQ පාඨමාලාව - NVQ Training Programme in Offset Lithopress Operation for School Leavers (Full time)**

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණ කාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩ සටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියා කරවීම ඇතුළු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

**පාඨමාලා කාලය - මාස 14 යි (පූර්ණ කාලීන)   මාධ්‍යය - සිංහල   පාඨමාලා ගාස්තුව : රු. 20,850**

**පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම**
**Computer Typesetting and Layout Design**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මුද්‍රණ ග්‍රැෆික් ප්‍රචාරක හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස් වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි.

**කාලය : මාස 5යි (අර්ධ කාලීන)   මාධ්‍ය : සිංහල /ඉංග්‍රීසි   පාඨමාලා ගාස්තුව : රු. 12,850**

**පරිගණක ආශ්‍රිත ග්‍රැෆික්ස් නිර්මාණකරණය - Computer Graphic Design**

ග්‍රැෆික්, මුද්‍රණ හා මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස්කර ඇති අතර ඒ තුළින් අද ග්‍රැෆික් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබාදෙයි. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ නියැළෙන පුද්ගලයින්ට මනා දැනුම ද පුහුණුව ද ලබා දේ.

**කාලය - මාස 4 1/2යි (අර්ධ කාලීන)   මාධ්‍ය - සිංහල/ඉංග්‍රීසි   පාඨමාලා ගාස්තුව : රු. 15,350**

**මයික්‍රොසොෆ්ට් ඔෆීස් - Microsoft Office**

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ පුහුණුවක් ලබා දෙන අතර පරිගණක භාවිතය පිළිබඳවද මූලික දැනුම හා අවබෝධය ද ලබා දේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය නවකයින්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු පුද්ගලයින්ට ද Ms Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා දේ.

**කාලය : මාස 4යි (අර්ධ කාලීන)   මාධ්‍ය : සිංහල සහ ඉංග්‍රීසි   පාඨමාලා ගාස්තුව : රු. 10,850**

**වෙබ් අඩවි නිර්මාණය - Web Designing**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ නවීන තාක්‍ෂණයට අනුකූලව පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබා දේ. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයින්ට හා මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයින්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

**කාලය : මාස 4යි (අර්ධ කාලීන)   මාධ්‍ය : සිංහල /ඉංග්‍රීසි   පාඨමාලා ගාස්තුව : රු. 15,350**

**අරේඛීය සංස්කරණය - Non Linear Editing**

මෙම පාඨමාලාව තුළින් රූපවාහිනී වැඩසටහන් සංස්කරණය සහ පිටපත් රචනය පිළිබඳ පූර්ණ ප්‍රායෝගික සහ න්‍යායාත්මක අවබෝධය ලබා දේ. පාසල් හැරගිය සිසුන්ට ද වීඩියෝ, රූපවාහිනී, චලන රූප කර්මාන්තයේ සහ ඉලෙක්ට්‍රොනික් සන්නිවේදන සහ චිත්‍රපට කර්මාන්තයේ නිරතවූවන් හටද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

**කාලය : මාස 04 (අර්ධ කාලීන)   මාධ්‍ය : සිංහල සහ ඉංග්‍රීසි   පාඨමාලා ගාස්තුව : රු. 20,850**

**ත්‍රිමාණ සජීවිකරණය - Digital Animation**

මෙම පාඨමාලාව තුළින් පරිගණක ආධාරයෙන් ද්විමාන සහ ත්‍රිමාණ චලන රූප නිර්මාණකරණය කිරීම සහ එම රූප, රූපවාහිනී සහ චිත්‍රපට මාධ්‍ය සඳහා යොදා ගන්නා අයුරු සවිස්තරාත්මකව පුහුණු කෙරේ.

**කාලය - මාස 06 (අර්ධ කාලීන) මාධ්‍යය - සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව - රු. 20,850**

**පොත් බැඳීම හා නිමාකරණය - Book Binding and Finishing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. මේ තුළින් පොත් බැඳීම, නිමාව පිළිබඳ පුළුල් අවබෝධයක් හා න්‍යායාත්මක පුහුණුවක් ලබාදේ. මෙම පාඨමාලාව පාසැල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයින්ට ද මහත් ප්‍රයෝජනයක් වනු ඇත.

**පාඨමාලා කාලය - මාස 07 (අර්ධ කාලීන) මාධ්‍යය - සිංහල පාඨමාලා ගාස්තුව : රු. 15,850**

**ඕෆ්සෙට් පත්ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරණය - Sheet Fed Lithopress**

මෙම පාඨමාලාව තුළින් පත්ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ පුළුල් ප්‍රායෝගික පුහුණුවක් ලබා දේ. මෙම පාඨමාලාව න්‍යායාත්මක හා ප්‍රායෝගික පන්තිවලින් සමන්විතවන අතර ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට මෙන්ම මුද්‍රණ ක්ෂේත්‍රයේ පත්ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරණයට උනන්දුවන නවකයන්ට සුදුසු වන සේ සකස් කොට ඇත.

**පාඨමාලා කාලය - මාස 08යි (අර්ධකාලීන) මාධ්‍යය - සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව - රු. 15,350**

**මුද්‍රණය සඳහා ග්‍රැෆික්ස් නිර්මාණ සැකසුම - Design for Print**

මුද්‍රණ රටා නිර්මාණකරණයේ දී ප්‍රායෝගිකව මුහුණ දෙන ගැටළු මෙන්ම රටා නිර්මාණකරණ සංකල්ප පිළිබඳව පුළුල් අවබෝධයක් හා දැනුමක් මේ තුළින් ලබා දේ. පරිගණක ග්‍රැෆික්ස් නිර්මාණ ජාත්‍යන්තර මට්ටමට නිර්මාණය කර ඒවා මුද්‍රණයට සුදුසු ලෙස සකසන අයුරු මෙම පාඨමාලාව තුළින් මැනවින් පැහැදිලි කෙරේ.

**කාලය - වසර 01යි (අර්ධකාලීන) මාධ්‍යය - සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව - රු. 12,350**

නොමිලේ සම්මන්ත්‍රණයක්

ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා තාක්ෂණය පිළිබඳව සහ ඊට අදාළ මෘදුකාංග (Software) භාවිතය පිළිබඳව නොමිලේ සහභාගිවිය හැකි සම්මන්ත්‍රණයක් 2015 ජූනි මස 21 ඉරිදා පෙ. ව. 8.30 සිට ප. ව. 2.30 දක්වා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ දී පැවැත් වේ. ඉඩකඩ සීමිත නිසා 011 - 2686162 හෝ 011 - 2679791 දුරකථන අංක අමතා ආසනයක් වෙන් කරවා ගන්න.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියකට අනුව ක්ෂේත්‍රයේ රැකියාවලට ගැලපෙන අයුරින් සකස්කොට ඇති අතර පාඨමාලා සාර්ථකව නිමාකරණ සිසුන් හට රජය හා ජාත්‍යන්තරව පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

පාඨමාලා අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 08.
දුරකථන : 011 2686162, 011 2679791
ෆැක්ස් : 011 2686162, ඊමේල් : sliopdir@sltnet.lk
වෙබ් අඩවිය : www.sliop.edu.lk

ශාඛා :-
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ.
දුරකථනය : 066 2222172
ජංගම : 071 0554298

06-250

---

## II වන ශ්‍රේණියේ ග්‍රාම නිලධාරීන් I වන ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2015

ග්‍රාම නිලධාරි සේවයට අයත් පහත සඳහන් සුදුසුකම් ඇති II වන ශ්‍රේණියේ ග්‍රාම නිලධාරීන් එම සේවයේ I වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. විභාග කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ලබන දිනයක ඔහු විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත අපේක්ෂකයින් ග්‍රාම නිලධාරි සේවයේ I වන ශ්‍රේණියේ උසස්වීම් සඳහා තෝරාගනු ලැබේ. ඒ සඳහා ලිඛිත පරීක්ෂණයට නියමිත සෑම විෂයකින්ම අවම වශයෙන් 40%ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු අතර, උසස් කිරීමේ බලධාරියා වශයෙන් මවිසින් තීරණය කරනු ලබන දිනයක සිට උසස්වීම් ලබා දීමට තීරණය කරනු ඇත. එම දිනට නිලධාරියා සේවයේ නොසිටී නම් එම උසස්වීම් සඳහා හිමිකම් නොලබනු ඇත. උපලේඛනය අංක 01හි නගර මට්ටමින් ඉදිරිපත් වන අයදුම්පත් සංඛ්‍යාව සලකා විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග පැවැත්වෙන මධ්‍යස්ථානය නම් කරනු ලැබේ.

03. සීමිත තරග විභාග පරිපාටිය - අපේක්ෂකයින් පහත සඳහන් විෂයයන්ට පෙනී සිටිය යුතු ය.

(1) සාමාන්‍ය බුද්ධිය - පැය 01යි. ලකුණු 100යි.

(2) වෘත්තීය දැනුම - පැය 01 1/2යි. ලකුණු 100යි.

04. *විෂය නිර්දේශය* :

(1) සාමාන්‍ය බුද්ධිය - අපේක්ෂකයාගේ සංඛ්‍යාමය හැකියා හා භාෂාමය කුසලතා, ගැටලු නිරාකරණය, තර්කන ශක්තිය, තීරණ ගැනීමේ හැකියාව ඇතුළු සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සකස් කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

(2) වෘත්තීය දැනුම - විෂයානුබද්ධ කෙටි ප්‍රශ්න වලින් සමන්විත පහත සඳහන් කොටස් දෙකකින් යුත් ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

I කොටස ඃ

ව්‍යවස්ථාපිත කටයුතු - කාර්යාල ක්‍රම හා පරිපාලනය සහ අදාළ අඥාපනත් හා නීති රීති පිළිබඳ දැනුම සම්බන්ධ වූ ප්‍රශ්න පත්‍රයකි. රාජ්‍ය මුදල් පිළිබඳ වගකීම, දිනපොත, තක්සේරු කාර්යයන්, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත, 1980 අංක 44 දරන ඡන්ද දායකයින් ලියාපදිංචි කිරීමේ පනත, රජයේ ඉඩම් ආරක්ෂා කිරීමට අදාළ පනත්, රජයේ ඉඩම් අත්කර ගැනීමේ පනත, පරිසර සංරක්ෂණ පනත, වන සතුන් හා වෘක්ෂලතා රක්ෂණයට අදාළ නීතිරීති, කැළෑ ආඥාපනත, මුස්ලිම් විවාහ හා දික්කසාද පනතේ පැවරෙන රාජකාරි, උඩරට විවාහ, දික්කසාද පනත, ධීවර හා වෙළඳ සංරක්ෂණය, ප්‍රාදේශීය සභා පනත, ගොවිජන සේවා පනත, පුරා වස්තු සංරක්ෂණය, වාරිමාර්ග පනත යන පනත් සහ ඊට ඇතුළත් රෙගුලාසි යටතේ ග්‍රාම නිලධාරීන් සතු වගකීම හා කාර්යභාරයන් පිළිබඳ දැනුම මැන බලනු ඇත.

II කොටස

ව්‍යවස්ථාපිත නොවන කටයුතු - මහජන සම්බන්ධතාවය, සංවර්ධන පරිපාලනය, සංවර්ධනයේ විපර්යාකාරක කටයුතු, දිළිඳුබව තුරන් කිරීමේ වැඩසටහන්, ග්‍රාමීය සංවර්ධන සැලසුම් සම්පාදනය, ප්‍රාදේශීය මට්ටමේ පරිපාලනයේ සිදු කරන ලද ප්‍රධාන වෙනස්කම්, පරිසර දූෂණය හා එහි ඵල විපාක, රජයේ අපනයන සංවර්ධන වැඩ පිළිවෙළ, ග්‍රාමීය සේවා වියුක්තිය යන කරුණු පිළිබඳව ග්‍රාම නිලධාරියෙකුගේ දැනුම විමර්ශනයට ලක් කෙරේ.

05. *සුදුසුකම්* :

(i) 2006.01.01 දිනට පෙර ග්‍රාම නිලධාරි සේවයේ II ශ්‍රේණියට බඳවා ගනු ලැබූ හෝ අන්තර්ග්‍රහණය කරනු ලැබූ නිලධාරියෙකු වීම.

(ii) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට ග්‍රාම නිලධාරි සේවයේ II ශ්‍රේණියේ වසර 10ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. ( II ශ්‍රේණියේ වසර 10ක සේවා කාලයට සමෘද්ධි/ගොවි නියාමක/කෘෂි ව්‍යාප්ති සේවක/විශේෂ නිලධාරි/වගා නිලධාරි වශයෙන් සේවයේ යෙදී සිට ග්‍රාම නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය කරන ලද අයකු නම් එම පූර්ව සේවාවේ ස්ථිර සේවා කාලයද ඇතුළත් වේ. එමෙන්ම දේශපාලන හේතූන් මත 1977 වර්ෂයේ දී රැකියා අහිමිව අංක අමප/97/0419/05/016 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 1995 දී නැවත සේවයේ පිහිට වූ නිලධාරීන්ගේ සේවා කාලය 1977 වසරේ මුල් පත්වීම ලද දිනයේ සිට ගණන් ගනු ඇත.)

(iii) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්නතම වසර 05ක සතුටුදායක සේවා කාලයක් තිබීම.

(iv) එදිනට පෙර ග්‍රාම නිලධාරි සේවයේ අනුමත කාර්ය පටිපාටියට අනුකූලව කාර්යක්ෂමතා කඩඉමෙන් සමත්ව සිටීම/නිදහස් කර තිබීම.

සටහන : II වන ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉමෙන් ඔබ්බට යාම වැටුප් තලය ගැන නොසලකා දස අවුරුදු සේවා කාලයක් සම්පූර්ණ කළ II වන ශ්‍රේණියේ ග්‍රාම නිලධාරීන්ගේ සතුටුදායක වැඩ, හැසිරීම්, පැමිණීම යන කරුණු පිළිබඳ ඔවුන් සේවය කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන ලද සහතිකයක් මත රඳා පවතී.

06. *වැටුප් ක්‍රමය* :

(i) ග්‍රාම නිලධාරි සේවයේ I වන ශ්‍රේණිය සඳහා මාසිකව රු. 17,550 x 5 x 240 - 14 x 320 - රු. 23.230.
(2010.09.29 දින සිට ක්‍රියාත්මක නව බඳවා ගැනීම් පටිපාටිය අනුව)

(ii) උසස්වීම් ලබන නිලධාරීන් ඉහත සඳහන් වැටුප් පරිමාණයේ නියමිත වැටුප් පියවරෙහි තබනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (iii) (iv) න් කරන ලද සංශෝධන වලට හා ඉදිරියේ සිදු කරනු ලබන සංශෝධනයන්ට අනුකූලවය.

07. *විභාග පටිපාටිය* :

(i) ග්‍රාම නිලධාරි සේවයට ඇතුළත්වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂාවෙන් අයදුම්කරුවන්/අයදුම්කාරියන් විසින් ප්‍රශ්න පත්‍ර 02කට පිළිතුරු සැපයිය යුතුය. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුණු අය, තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ සිංහල භාෂාවෙන් හෝ දෙමළ භාෂාවෙන් හෝ ප්‍රශ්න පත්‍ර දෙකටම එක් භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය. ඔබ විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කරන ලද භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ii) මෙම විභාගය සඳහා අයදුම් කිරීමේ ආදර්ශ අයදුම්පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ පළකර ඇත. ආදර්ශ අයදුම්පතට අනුකූලව පමණක් අයදුම්කරුවන් හෝ අයදුම්කාරියන් විසින් තමන්ගේ අයදුම්පත් පිළියෙල කර ගැනීම අවශ්‍ය වේ. අයදුම්පත් ඒ4 කඩදාසි පිටුවක පිළියෙල කළ යුතුය. අංක 01 සිට 05 දක්වා එහි මුල් පිටුවේ ද, ඉතිරි කොටසේ ඉදිරි පිටුවලද සකස් කළ යුතුය. අයදුම්පත් යතුරු ලියනය/පරිගණකය ආධාරයෙන් පිළියෙල කර ගත හැකි අතර මෙහි දැක්වෙන උපදෙස් පරිදි නිවැරදිව හා පැහැදිලිව තම අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

(iii) නිලධාරියාගේ රාජකාරි ලිපිනයට අමතරව ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනයද අයදුම්පත්‍රයෙහි සඳහන් කළ යුතුය. මෙම ලිපිනය අවශ්‍ය වන්නේ අයදුම්කරුවන්ට ප්‍රමාදයකින් තොරව

විභාග ප්‍රවේශ පත්‍ර ලබාදීමට පමණක් බව සලකන්න. උසස්වීම ලබාදීමේදී එම ලිපිනය කිසිසේත් පිටිවහලක් නොවන බව අවධාරණයෙන් දක්වනු ලැබේ.

08. *අයදුම්පත් භාර ගැනීම* .- අයදුම්පත් පිටපත් දෙකකින් සම්පූර්ණ කළ යුතුය. එක් පිටපතක් තමාගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇතුළත් කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙතද, අනෙක් පිටපත විභාග කොමසාරිස් වෙත ද පහත දැක්වෙන උපදෙස් පරිදි එවිය යුතුය.

(i) සියලුම විභාග අපේක්ෂකයින් තම අයදුම්පත් තමා සේවය කරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය අයත් ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ සහිතව "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2015 ජූලි 02 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය.

(ii) අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "II ශ්‍රේණියේ ග්‍රාම නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත කරග විභාගය - 2015" යනුවෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

09. *විභාග ගාස්තු* .- පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් වන අතර අනෙක් අයදුම්කරුවන් සඳහා විභාග ගාස්තුව රු. 300.00කි. මෙම ගාස්තු විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා ලබාගන්නා ලදුපත අයදුම්පතේ නිසි කොටුවෙහි එහි දාරයකින් අලවා ලදුපත් අංකය, දිනය හා තැපැල් කාර්යාලය සඳහන් කර තිබිය යුතුය. එම ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කිසිදු හේතුවක් නිසාවත් ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර මෙම විභාග ගාස්තු කිසිම විභාගයකට මාරු කිරීමට ද සලකා බලනු නොලැබේ. විභාග ගාස්තු ගෙවීම සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, එවැනි අයදුම්පත් කිසිම දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. විභාගයට ඇතුළත් කර ගැනීම :

(i) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර, නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග (අදාළ නම් පමණි) නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ ප්‍රවේශ පත්‍ර අත්සන සහතික කරවා ගෙන ඉදිරිපත් කළ යුතුය. එම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ii) සියලුම විභාග අපේක්ෂකයින් රජයේ ගැසට් පත්‍රයේ පළ කරන විභාග නීතිරීති පිළිබඳව අවබෝධයක් ලබා සිටිය යුතු අතර, ඒවා පිළිපැදීමට බැඳී සිටිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් විය යුතු අතර, එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත. මෙම විභාග නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති මෙම විෂයට අදාළ කවර කරුණක් පිළිබඳ වුව ද මාගේ තීරණය අවසාන තීරණය වන්නේය.

11. විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති අපේක්ෂකයින්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දෙනු ලැබේ. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

12. හැඳුනුම්පත් .- අපේක්ෂකයින් විසින් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපතිට ඒත්තු යන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරෙන් කුමක් වුවත් භාරගනු ලැබේ.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය;

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

13. අයදුම්පත් පිළිගෙන ඇති සියලුම විභාග අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2 ක් හෝ 3 ක් ගත් වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකය ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපියක් පහත සඳහන් විස්තර සමග දැන්වීමෙහි සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර ඒ පිළිබඳ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් තබා ගැනීමද ප්‍රයෝජනවත් වනු ඇත.

පහත සඳහන් තොරතුරු ඔබ සතුව තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

1. විභාගයේ නම :————.
2. අයදුම්කරුගේ/අයදුම්කාරියගේ සම්පූර්ණ නම :————.
3. ලිපිනය :————.
4. තැපැල් කාර්යාලය, ලියාපදිංචි කළ අංකය සහ යැවූ දිනය :————.
5. විභාග ගාස්තු ගෙවන ලද තැපැල් කාර්යාලය :————.
6. කුවිතාන්සි අංකය හා දිනය. :————.

14. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා අනුව කටයුතු කරනු ලැබේ.

ලේකම්,
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2015 මැයි මස 19 වැනි දින,
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

**ආදර්ශ අයදුම්පත්‍රය**

II වන ශ්‍රේණියේ ග්‍රාම නිලධාරීන් 1 වන ශ්‍රේණියට උසස් කිරීමේ
සීමිත තරග විභාගය - 2015
Limited Competitive Examination for the Promotion of Grade II
Grama Niladaries to Grade I - 2015

(අංක 01 සිට 05 දක්වා මුල් පිටුවේද, අංක 06 සිට ඉදිරි පිටුවලට ඇතුළත් කළ යුතු ය.)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.)

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

| | විභාගයට ඉල්ලුම් කරන නගරය | නගර අංකය |
|---|---|---|
| පළමු තේරීම | | |
| දෙවන තේරීම | | |

(උපලේඛනය අංක - 01 බලන්න.)

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

I වැනි කොටස

(සැළකිය යුතුයි : ආකෘති පත්‍රය නිවැරදිව සහ පැහැදිලිව පිරවිය යුතුයි.)

01. (i) (අ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.
(උදා :- HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
(ආ) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.
(උදා :- GUNAWARDHANA, H. M. S. K.)
(ii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :—————.

02. (i) රාජකාරී ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.
(ii) ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.

03. (i) ජාතික හැඳුනුම්පත් අංකය
(ii) ස්ත්‍රී/පුරුෂ භාවය
පුරුෂ - 0
ස්ත්‍රී - 1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

04.
(i) දැනට සේවය කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————.
(ii) දැනට සේවය කරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය :

අංකය :

05. උපන් දිනය :

අවුරුද්ද මාසය දිනය

06. දැනට දරන තනතුරට පත්වූ දිනය/අන්තර්ග්‍රහණය කරන ලද නිලධාරියෙකු නම් ඒ පිළිබඳ විස්තර (අදාළ කොටස පමණක් සම්පූර්ණ කරන්න.)

| | ඇතුළත්ව සිටි සේවය | ඇතුළත් වූ දිනය | සේවා කාලය |
|---|---|---|---|
| (අ) | විශේෂ සේවා නිලධාරී | ————— | ————— |
| (ආ) | වගා නිලධාරී සේවය | ————— | ————— |
| (ඇ) | කෘෂි ව්‍යාප්ති සේවය | ————— | ————— |
| (ඈ) | සමෘද්ධි හෝ ගොවි නියාමක සේවය | ————— | ————— |
| (ඉ) | වෙනත් | ————— | ————— |

07. (i) සේවා කාලය තුළ සියලුම වැටුප් වර්ධක ඔබ උපයාගෙන තිබේ ද? :—————.
(ii) එසේ නැතිනම් විස්තර සඳහන් කරන්න. :—————.

08. සංස්ථාවක හෝ වෙනත් සේවාවක සේවය සඳහා ඔබ දැනට මුදාහැර ඇත්නම් ඒ පිළිබඳ විස්තර සපයන්න. :—————.

09. ඔබ විදේශ රැකියාවක් සඳහා හෝ වෙනත් කාර්යයන් සඳහා වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇත්නම් විස්තර දක්වන්න :—————.

10. ඔබට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගෙන තිබේ ද ? :—————.
ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න. :—————.

11. *සැලකිය යුතුයි.-ගැසට් පත්‍රයේ දැක්වෙන පරිදි විභාග ගාස්තු සඳහා නියමිත මුදල් ගෙවූ බවට තැපැල් කාර්යාලයෙන් ලබා ගත් කුවිතාන්සියේ එක් දාරයකින් මෙහි නොගැලවෙන සේ ඇලවිය යුතුය.*

කුවිතාන්සිය අංකය :—————.
තැපැල් කාර්යාලය :—————.
දිනය :—————.
මුදල : රුපියල් :—————.

…………………… වන මා විසින්, 1-11 දක්වා සඳහන් කර ඇති සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. තවද, මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුනහොත් මෙම සේවාවේ 1 ශ්‍රේණියට උසස්වීම පිළිබඳ වූ මගේ හිමිකම් අහිමි කිරීමට ද, මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමට හැකි බව මම හොඳාකාරව දන්නා අතර, ඒ අනුව කටයුතු කිරීම ගැන මම විරුද්ධ නොවන බවත් මෙයින් දන්වා සිටිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

II වැනි කොටස

ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සම්පූර්ණ කළ යුතුය.

(i) …………… මහතා/මහත්මිය/මෙනෙවිය ඉහත සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව සමඟ සසඳා බලන ලදුව ඒවා නිවැරදි බවත්,

(ii) ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්,

(iii) පූර්වාසන්න පස් වසර තුළ ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායකව පැවති බවත් …………… දින සිට ග්‍රාම නිලධාරි II වන ශ්‍රේණියට පත් කරනු ලැබ ඇති බවත් …………… දින සිට කාර්යක්‍ෂමතා කඩඉමෙන් ඔබ්බට උසස් කරනු ලැබ/නිදහස් කර ඇති බවත් මේ සමඟ ඉදිරිපත් කර ඇති අයදුම්පතේ පිටපත නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුවේ අමුණන ලද බවත් සහතික කරමි.

(iv) අයදුම්කරු නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවද, එම ලදුපත නියමිත කොටුවෙහි අලවා ඇති බවද සහතික කරමි.

————,
ප්‍රාදේශීය ලේකම්,

නම :————.
පදවි නාමය :————.
නිල මුද්‍රාව :————.
දිනය :————.
(නොගැලපෙන වචන කපා හරින්න.)

උපලේඛනය අංක - 01

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 02 |
| ගාල්ල | 03 |
| මාතර | 04 |
| යාපනය | 05 |
| මන්නාරම | 06 |
| මුලතිව් | 07 |
| ත්‍රිකුණාමලය | 08 |
| මඩකලපුව | 09 |
| කුරුණෑගල | 10 |
| අනුරාධපුරය | 11 |
| බදුල්ල | 12 |
| රත්නපුර | 13 |
| කිලිනොච්චි | 14 |

06-259